දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

| 44 | S | II |
|---|---|---|

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர )சாதாரண தர(ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)
G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)

නැටුම් (දේශීය) I,II
நடனம் (சுதேச) I,II
Dancing (Oriental) I,II

නැටුම් (දේශීය) II

* පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **පළමුවැනි** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක් ද** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකටම ලකුණු 12 බැගින් හිමි වේ.

**1. සියලු ම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංක යොදා ඉදිරියෙන් ලියන්න.**

(i) රස හා භාව සංකල්පය පිළිබඳ භරතමුනි විසින් ලියන ලද ශාස්ත්‍රීය ග්‍රන්ථය වන්නේ.................................. යි.

(ii) " කටදොඩවන්නේ ගිය ගිය තැන පෙරලෙන්නේ " යන කවි පදයෙන් කියවෙන ගැමි නාටකයට අයත් චරිතය වන්නේ…………ය.

(iii) .................................. වට්ටම මාත්‍රා 2 + 2 + 4 තාලරූපයට අයත් වේ.

(iv) ශාන්ති කර්ම ආශ්‍රිතව සැරසිලි නිර්මාණය කිරීමේදී ..................................කලාවෙන් ලැබෙන පිටිවහල වැදගත් වේ.

(v) මණිපූරි නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන අවනද්‍ය භාණ්ඩය .................................. නමින් හඳුන්වයි.

(vi) "පහත රට ශාන්ති කර්ම සාහිත්‍ය " කෘතිය රචනා කරන ලද්දේ.................................. මහතාය.

(vii) "අයිලය " යනු උඩරට නර්තන සම්ප්‍රදායට අයත් .................................. ශාන්ති කර්මයේ ප්‍රධාන සැරසිල්ලකි.

(viii) 1968 වර්ෂයේදී **රන්දද** නැමැති මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ .................................. මහතාය.

(ix) මනිපුරි නර්තන සම්ප්‍රදායේ රාධාගේ රංගවස්ත්‍රාභරණවලට අයත් කෙටිසාය හා හිසට පළඳින වේලය හඳුන්වන නාමයන් වන්නේ (1).................................. ,(2) .................................. .

(x) නර්තන කලාවේ නූතන ප්‍රවණතා ලෙස පහත සඳහන් වර්ෂවල සිදුවූ සුවිශේෂී සිදුවීම් වන්නේ,
1952 (1) .................................. , 1956 (2) .................................. .

**2.**

(i) මාත්‍රා 3+4 උඩරට හෝ පහතරට හෝ සබරගමු සම්ප්‍රදායට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න.

(ii) පහත දැක්වෙන කවි පද කොටස මාත්‍රා 2 + 3 තාල රූපයට ප්‍රස්තාර කරන්න .
"පානා අසිරි නොහැර පානා දෙනෙත් කුසුම"

(iii) සිංහරාජ වන්නමේ අඩව්ව හෝ අනුරාගදණ්ඩ තාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ විරාඩි වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න.

**3.** පහත සඳහන් මාතෘකා අතුරින් තුනක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.
 (i) වන්නම්
 (ii) නමස්කාර ගාථා
 (iii) මිරැන්ඩා හේමලතා මහත්මිය
 (iv) අංග රචනය
 (v) කරදිය මුද්‍රා නාට්‍යය

**4.** දේශීය ශාන්ති කර්ම පිළිබඳ විමසීමේ දී පූජාවිධි රටාවේ අන්තර්ගත පොදු ලක්ෂණ මෙන්ම අනන්‍යතා ලක්ෂණ ද පිළිබිඹු වේ.
 (i) පහන් මඩුවේ අන්තර්ගත චාරිත්‍රවිධි දෙකක් නම්කර කෙටියෙන් හඳුන්වන්න.
 (ii) දෙවොල්මඩු ශාන්තිකර්මයට පමණක් ආවේණික වූ ගායනය සහිත නර්තන අංගයක් නම්කර එය විස්තර කරන්න.
 (iii) කොහොඹාකංකාරි ශාන්තිකර්මයේ කතා පුවතෙන් පිළිබිඹු වන මානව ගුණධර්ම පිළිබඳ ඇගයීමක් කරන්න.

**5.** (i) සිංහල ගැමි නැටුමේ එන කළ ගෙඩි නැටුමට සමාන ද්‍රවිඩ ගැමි නැටුම නම් කර ඒ පිළිබඳ ව කෙටියෙන් පැහැදිලි කරන්න.
 (ii) ගැමි නැටුම හා සම්බන්ධ ගායනාවලින් පිළිබිඹු වන ඇදහිලි හා විශ්වාස පිළිබඳ ව උදාහරණ දෙමින් විස්තර කරන්න.
 (iii) "කෝළම් නාටකය මඟින් සමාජ විවරණයක් සිදු වේ."මෙම කියමන පැහැදිලි කරන්න.

**6.** පහත දැක්වෙන රූප ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


A


B



C

 (i) A රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය සඳහන් කර නර්තන අංග තුනක් නම් කරන්න.
 (ii) B රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය නම්කර එය ආහාර්ය අභිනයෙන් පොහොසත් බවට කරුණු ඉදිරිපත් කරන්න.
 (iii) C රූපයේ දැක්වෙන කලා කෘතිය නම් කර එහි සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.

**7.** (i) නර්තන කලාව හැදෑරීමෙන් අත්පත් කර ගත හැකි මානවීය ගුණාංග දෙකක් ඇගයීමට ලක් කරන්න.
 (ii) නර්තන කලාවේ උන්නතියට වේදිකා ප්‍රසංගවල දායකත්වය පැහැදිලි කරන්න.
 (iii) අන්තර්ජාතික වශයෙන් නර්තන කලාව හැදෑරීමේ වැදගත්කම විස්තර කරන්න.

*****